---

**බුලත්සිංහල ප්‍රාදේශීය සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය පකාශන 2012 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාර් 21 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වරෙන්තු ගාස්තු ආදායම්, මුද්දර ආදායම් හා වැටුප් හා වේතන වියදම ගිණුම් ගත කිරීමේදී වර්ෂය ආරම්භක හා අවසාන ශේෂයන් ගලපා නොතිබීම නිසා වර්ෂයේ ආදායම හා වියදම පිළිවෙලින් රු.1,046,250 ක් හා රු.72,127 ක් අඩුවෙන් දැක්විණ.

(ආ) 2011 වර්ෂයේ ණයහිමි ගිණුමට උපචිත කර තිබූ වියදම රු.1,730,408 ක් වුවත් 2012 ජනවාර් 01 දිනට ණයහිමි ගිණුමේ ශේෂය රු.8,384 ක් වී තිබුණි. ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණය අනුව 2012 ණයහිමියන් සඳහා ගෙවා තිබූ රු.1,803,871 ක් ණයහිමි ගිණුමට ගිණුම් ගත නොකර 2013 වර්ෂයේදී ණයහිමියන් සඳහා ගෙවා තිබූ රු.1,168,342 ක් ණයහිමි ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සභාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට එකතු කළ අගය මත බදු ගෙවීම් කිරීමේදී සභාවට ලද එකතු කළ අගය මත බදු ආදායමින් (නිමවුම්) සභාව විසින් ගෙවා ඇති (යෙදවුම්) එකතු කළ අගය මත බදු වියදම් ගලපා ඉතිරිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත

ප්‍රේෂණය කළ යුතු වුවත් ලැබී තිබූ සමස්ථ එකතු කළ අගය මත බදු ආදායම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබුණි.

(ඈ ) 2012 වර්ෂයේදී මිලදී ගෙන නිකුත් කර තිබූ ටයර් වල වටිනාකම වූ රු.609,139 ක් සමාලෝචිත වර්ෂය අවසානයට පොදු ගබඩා තොග ශේෂයට ඇතුළත් කිරීම නිසා ගබඩා ශේෂය රු.609,139 කින් වැඩියෙන් දැක්විණ.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව ගිණුම් ගත කිරීමට හේතුව නිරීක්ෂණය නොවූ රු.199,090 ක් සමුච්චිත අරමුදලට බැර කර තිබූ අතර අවිච්ජේද කර්මාන්ත සඳහා බිල් කිරීම් ලෙස රු.16,848,511 ක් එම ගිණුමට බැර කර තිබුණි. නමුත් මෙම සටහන්වලට අදාල ප්‍රතිවිරුද්ධ සටහන් ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) 2009 වර්ෂයේ සිට දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් ලැබී තිබූ රු.2,556,279 ක ණය මුදල ණය ගිණුමට ගිණුම් ගත කර නොතිබුණි.

(උ) අවිච්ජේද කර්මාන්ත සඳහා ලැබිය යුතු මුදල් රු.2,026,299 ක් ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයගැති ගිණුමට පමණක් හර කර තිබීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත ගිණුම පමණක් බැර කර තිබුණි.

(ඌ) කර්මාන්ත ණයගැතියන් කපාහැරීම් රු.26,014,349 ක් ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයගැති ගිණුම පමණක් බැර කර තිබීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත ගිණුම පමණක් හර කර තිබුණි.

(එ) කර්මාන්ත ණයහිමියන් රු.29,600,825 ක් වැඩියෙන් බිල් කිරීම ඉවත්කිරීම සඳහා ඉකුත් වර්ෂයේ කර්මාන්ත ණයහිමි ගිණුම පමණක් හර කිරීම නිවැරදි කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී අවිනිශ්චිත ගිණුම පමණක් බැර කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී ස්ථාවර තැන්පත් කල් පිරීමෙන් ලැබී තිබූ රු.2,500,000 ක් මුදල් ගිණුම හර කර ස්ථාවර තැන්පත් හා වෙනත් ආධාර යන ගිණුම් දෙකම බැර කර තිබුණි.

(ඔ) කර්මාන්ත මුදල් ගණුමෙන් පොදු මුදල් ගිණුමට රු.2,600,000 ක් මාරු කිරීමේදී අදාල මුදල් ගිණුම් හර හා බැර වී තිබියදී ආදායම් ආධාර ගිණුමද බැර කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,670,959 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,915,803 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 570 | 384 | 201 |
| (ii.) | බදු කුලී | 25 | 4 | 488 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 150 | 133 | 24 |

2:2:2 අක්කර බදු

2012 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.83,984 ක් වූ අතර ඉන් ඉඩම් හිමියන් 30 දෙනෙකුගෙන් අවු.05 ට වැඩි කාලයක් තුළ දිගින් දිගටම අය නොවී පැවත එන අක්කර බදු ශේෂය රු.66,706 ක් විය.

2:2:3 වෙළඳ බලපත්‍ර හා කර්මාන්ත බදු

2012 දෙසැම්බර් 31 දිනට ආයතන 37 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු රු.24,000 ක් ද, කර්මාන්ත 42 කින් කර්මාන්ත බදු රු.29,500 ක් ද අයවීමට තිබූ අතර ඒ සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගෙන අයකර ගැනීමට විගණිත දිනය වූ 2013 මාර්තු 22 දින වන විටත් කටයුතු කර නොතබුණි.

2:2:4 තොටුපල බදු

1988 වර්ෂයට පෙර සිට පැවත එන හිඟ තොටුපල බදු ශේෂය රු.11,863 ක් ද 1989 ට අදාල රු.25,168 ක්ද, 2000 සිට 2008 දක්වා අයවිය යුතු හිඟ ශේෂය රු.463,684 ක් ද විය. ඒ අනුව මුළු හිඟ බදු ශේෂය රු.500,716 ක් වූ අතර එම හිඟ ශේෂයන් අදාල වර්ෂවල අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා විගණිත දිනය වූ 2013 මාර්තු 22 වන විටත් හිඟව පැවතුණි.

2.2.5 වෙනත් ආදායම්

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත අනුව එක් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයකින් අයකර තිබූ රු.36,590 ක් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් ගෙන්වා ගැනීමට 2013 මාර්තු 30 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් 2010 ජනවාරි සිට 2012 දෙසැම්බර් දක්වා අයකර තිබූ මුද්දර ගාස්තු උපලේඛන ගෙන්වා ගැනීමට 2013 මාර්තු 19 වන විටත් කටයුතු කර නොතිබුණි.

2:2:6 උසාවි දඩ හා මද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 7,801,003 |
| (ii) මුද්දර ගාස්තු | 2,396,886 |

2.2.7 පරිසර බලපත්‍ර ගාස්තු

(අ) 2008, 2009, 2010 හා 2011 වර්ෂවල පරිසර ආරක්ෂණ බලපත්‍ර අවලංගු වී තිබූ ආයතන 04 කින් තවදුරටත් එම ආයතන පවත්වාගෙන යන්නේද යන්න තහවුරු කරගෙන නැවත බලපත්‍ර නිකුත් කිරීමට විගණිත දිනය වූ 2013 අප්‍රේල් 22 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) පරිසර බලපත්‍ර ලබා දිය හැකි ක්ෂේත්‍ර 25 හි සඳහන් ක්‍රියාකාරකම් හා සම්බන්ධ වන පරිසර දූෂණය වැළැක්වීම අඩු කිරීම හා පාලනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු වුවත් එසේ කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

2.3 ආර්ථික නොවූ ගනුදෙනු

තොටුපළ 18 ක් 2012 වර්ෂය සඳහා බදු දීමට රු.45,696 ක් වැය කර ටෙන්ඩර් කර තිබුණත්, ඉන් බදු දී තිබුණේ එක් තොටුපළක් පමණක් වන අතර, ලැබී තිබූ ආදායම රු.25,000 ක් විය.

2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව යම් ආගමික, පුණ්‍ය, සෞඛ්‍ය, විනෝදාත්මක හෝ අධ්‍යාපන කාර්යයක් සම්බන්ධයෙන් වියදම එක් වර්ෂයකට මුළු එකතුව රු.1,000 කට වඩා වැඩිවන්නේ නම් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ අනුමැතියකින් තොරව රු.32,537 ක් යෞවන සමාජයකට නිල ඇඳුම් ලබාදීමට හා දහම් පාසලකට පොත් ලබාදීම සඳහා ගෙවීම් කර තිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

2:5.1 අමරගෙදර කම්බොක්කාව පාර

අමරගෙදර කම්බොක්කාව ඉහළ කොටස මාර්ගය I අදියර යටතේ දිග මීටර් 225 ක් හා පළල මීටර් 2.4 ක් (පැති බැම්මද සහිතව) කුට්ටි ගල් ඇතිරීම සඳහා රු.890,140 ක් ගෙවා තිබුණි. 2013 මාර්තු 21 දින තාක්ෂණික නිලධාරිනිය සමඟ සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.18,000 ක් ගෙවා කුට්ටි ගල් සම්බන්ධ තත්ත්ව පරීක්ෂණ වාර්තාවක් ලබා ගෙන තිබුණද අතුරා තිබූ කුට්ටි ගල්වල චිප් ගල් මතු වී තිබූ අතර ගල් බොහොමයක් කැඩී තිබුණි.

(ආ) දෙපස කාණු සකස් කර උරහිස් සැකසීම සඳහා රු.6,000 ක් මුදල් ගෙවා තිබූ අතර එකී කාර්යය සිදු කර නොතිබූ බව

(ඇ) අවශ්‍ය ස්ථානවල ABC අතුරා ටොන් 1-2 රෝල යොදා තලා මට්ටම් කිරීම සඳහා රු.11,437 ක් ද, ඇතුරුම් තට්ටුව සකස් කිරීම හා ගල් කුඩු සපයා අතුරා මට්ටම් කිරීම සඳහා රු.28,390 ක්ද හා අතුරන ලද ගල්කුඩු තට්ටුව මත කම්පැක්ටරය යෙදීම සඳහා රු.5,000 ක් ගෙවීම් කර තිබූ නමුත් මාර්ගයේ බොහෝ ස්ථානවල කුට්ටිගල් එක් මට්ටමකට නොතිබූ අතර තැනින් තැන ගල් ගිලා බැස උස් පහත් වී තිබුණි.

2:5.2 පොලේගොඩ මහජන පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීම

පළාත් පාලන යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.7,535,372 ක ඇස්තමේන්තුගත වටිනාකමකට පුස්තකාල ගොඩනැගිල්ල ඉදි කර තිබුණි. මින් සියයට 93 ක් දේශීය ණය සංවර්ධන අරමුදලෙන් ලබා ගෙන තිබූ අතර සියයට 7 ක් සභාව විසින් දැරිය යුතු විය.

2013 මාර්තු 21 දින කරන ලද භෞතික පරීක්ෂණයේදි පහත කරුණු අනාවරණය විය.

(අ) පුස්තකාල ගොඩනැගිල්ලේ පිපිරීම් ඇති බව පුස්තකාල සහායක විසින් 2011 දෙසැම්බර් 07 දින වාර්තා කර තිබූ අතර 2012 සැප්තැම්බර් මාසයේ පිළිසකර කර අවසන් ගෙවීම සිදු කර තිබුණද එම බිත්ති සිවිලිමට යටින් පුපුරාගොස් ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ගොඩනැගිල්ලේ බිතති ඉතා උසට තනා තිබූ අතර වහලේ අගුව කෙටි වීම නිසා පැති දොරෙන් පුස්තකාලයට වැසි ජලය ගලා එන බවත් බිත්ති සියල්ලම අධික ලෙස තෙමීම සිදුවන බවත්ී නිරීක්ෂණය විය.

(ඇ) පුස්තකාල ගොඩනැගිල්ල ඉදිකිරීමට අවශ්‍ය විදුලිය සභාව සතු පොලේගොඩ ආදාහනාගාරයෙන් ලබා ගෙන තිබූ අතර ඒ සඳහා අයවිය යුතු රු.40,000 ක් අඩු කර නොගෙන කොන්ත්‍රාත්කරුට සියළුම ගෙවීම් කර තිබුණි.

## 2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

### 2.6.1 නිරවුල් නොකළ ගිණුම්

------------------------------

(අ) වර්ෂ ගණනාවක සිට ඉදිරියට ගෙන එමින් පැවත එන රු.17,798 ක් වූ විදුලි ගබඩා ශේෂය, රු.114,070 ක් වූ වීථි පහන් ආධාර ශේෂය සහ රු.491,753 ක් වූ ලැබිය යුතු එකතු කළ අගය මත බදු ශේෂය හඳුනාගෙන අයකර ගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ ගණනාවකට පෙර ලබා දී 2012 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබූ රු.43,859 ක් වූ අත්තිකාරම් ශේෂයක් අදාල පුද්ගලයින්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර 2013 ජනවාරි 10 දින සභා අනුමැතියෙන් කපා හැර තිබුණි.

### 2.6.2 සේවක ණය

--------------

ලිපිකරුවන් 5 කගෙන් හා එක් සෞඛ්‍ය කම්කරුවෙකුගෙන් අයවිය යුතු ආපදා, විශේෂ හා වෙනත් ණය ශේෂය වූ රු.86,504 ක් 2012 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ අතර 2013 මාර්තු 22 වන විටද මෙම ශේෂය නොවෙනස්ව පැවතුණි. ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.6.3 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

---

2.6.4 අයවැයකරණය

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් ශීර්ෂ 20 හි (කුලී ආදායම්) උප ශීර්ෂ 07 ක් යටතේ රු.27,500,000 ක ආදායමක් ඇස්තමේන්තුගත කර රු.563,150 ක් පමණක් 2012 දෙසැම්බර් 31 දිනට උපයා තිබූ අතර අදායම් උප ශීර්ෂ 4 කින් කිසිදු ආදායමක් උපයා නොතිබුණි.

(ආ) වැය ශීර්ෂ 53 ක් සඳහා එකතුව රු.10,039,500 ක් ප්‍රතිපාදනය කර තිබූ නමුත් ඉන් කිසිදු මුදලක් වියදම් කර නොතිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

--------------------

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පැධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) තොග පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඊ) අයවැයකරණය